**නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම - 2017/2018**

**-----------------------------------------------------------------**

නිපුණතා සංවර්ධන අරමුදල් සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලයුතුයැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට නිපුණතා සංවර්ධන අරමුදල් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමා කිරීම ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.5,485,778 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරන අගය මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

ප්‍රමිතයේ 9 'බී'ඡේදය අනුව රු. 2,024,276 ක් වූ සේවක ණය සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විලම්භිත බදු රු. 486,768 ක් සඳහා වූ උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධන හා සංචිත (Capital and Reserves )යටතේ වෙනත් සංචිත ලෙස පසුගිය වර්ෂ කිහිපයක සිට පැවතෙන රු.297,303 ක අසාමාන්‍ය ශේෂයක් පැවති අතර මෙම ශේෂය තහවුරු කිරීම සඳහා වූ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් ශිෂ්‍යත්ව අරමුදලෙහි වත්කම් ගිණුමේ රු.4,065,489 ක ශේෂයක් පැවති අතර වගකීම් ගිණුමෙහි රු. 3,723,109 ක ශේෂයක් වූයෙන් රු. 342,380 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඊට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>(i) මුදල් රෙගුලාසි 188 | බැංකුවට මුදල දමනු ලබන කල්හි, සෑහෙන කාලයක් තුළ මුදලක් බැර වූ බවට බැංකුව විසින් දන්වා නොමැති විට එකී කාරණය පිළිබඳ වහා විමර්ෂණය කළ යුතු වුවද, රු.72,500 ක් වූ උපලබ්ධි නොවූ තැන්පතු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 225 | වියදම් සඳහා වෙන් වෙන්ව පිළියෙල කරන ලද වවුචර ඉදිරිපත් කරනු වෙනුවට වියදම් කිහිපයක් සඳහා එකම වවුචරයක් ඉදිරිපත් කර ගෙවීම් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඈ) | චෙක්පත් නිකුත් කල දිනය, එය වලංගු කල දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 6 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ වටිනාකම රු. 388,713 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) - 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන චක්‍රලේඛය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරියෙකුගේ පූර්ව අනුමැතිය ගැනීමකින් තොරව සමාගමේ රියැදුරු හා කාර්යාල කාර්ය සහයක තනතුරු සඳහා එක් අයෙකුට රු. 10,000 ක උපරිමයකට යටත්ව අතිකාල දීමනා ලෙස 2017/2018 වර්ෂය තුල රු. 962,495 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ (සංශෝධිත) 21(1) වගන්තිය | 2017 මාර්තු 31 දිනෙන් හා ජුනි 30 දිනෙන් අවසන් වන කාර්තු වල එකතු කල අගය මත බදු වාර්තා සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් රු. 20,000 ක දඩයක් ගෙවීමට සිදු වී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනෙන් හා 2018 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තු සඳහා බදු වාර්තා සැපයීම පිළිවෙලින් දින 27 කින් හා දින 11 කින් ප්‍රමාද කර තිබුණි. |
| (ඈ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනතේ 2 (2) වගන්තිය | කාර්තුවක පිරිවැටුම රු.මිලියන 12.5 ඉක්ම වනවිට ආර්ථික සේවා ගාස්තු පනත යටතේ ලියාපදිංචි වියයුතු වුවද 2017/2018 තක්සේරු වර්ෂයේ කාර්තුවක පිරිවැටුම රු.මිලියන 12.5 ඉක්මවා තිබියදී එසේ ලියාපදිංචි වීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ වෙන් කිරීම්) පනත | සමාගම මෙම පනත යටතේ ලියාපදිංචි වී නොතිබුණු අතර 2017/2018 වර්ෂය සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව රු.14,650 ක් සේවකයින්ගෙන් අයකර නොතිබුණි. |
| (ඊ) 2016 අංක 22 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධිත) පනත | කාර්තුවක පිරිවැටුම රු.මිලියන.3 කට වඩා වැඩි වනවිට ජාතිය ගොඩනැගීමේ බදු ගෙවිය යුතු වුවද, 2017/2018 වර්ෂයේ පිරිවැටුම මත බදු ගෙවීමට සමාගම කටයුතු කර නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2011 නොවැම්බර් 18 වන දිනැති DMS/E4/47/9/282/1 දරන භාණ්ඩාගාර ලිපියට අනුව ජීවන වියදම් දීමනාව හැර වෙනත් දීමනා නොගෙවිය යුතු වුවද, ඊට පටහැනිව ගිණුම් වර්ෂය තුල රු.3,281,271 ක මුදලක් දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 6,544,228 ක බදු පෙර ලාභයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර අලාභය රු. 7,059,468 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,603,696 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු. 40,624,445 කින් වැඩි වී තිබීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය, වැඩසටහන් සඳහා සහභාගී වූ සංඛ්‍යාව හා ඉලක්කගත / සනාථ ආදායම් තත්ත්වය පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුල අධ්‍යයන වැඩසටහන් යටතේ ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා 13 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද, ඉන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව පමණක් පවත්වා තිබුණි. ඒ අනුව මෙම අංශයන්හි සත්‍ය ආදායම රු. 775,000 ක් වූ අතර එය ඉලක්ක ගත ආදායමෙන් 5 ක ප්‍රතිශතයක් විය.

(ii) විවෘත අංශයෙහි වැඩසටහන් 164 ක් වෙනුවෙන් රු. 56,020,000 ක ආදායමක් අපේක්ෂා කර තිබුණ ද වර්ෂය තුල වැඩසටහන් 95 ක් පමණක් පවත්වා තිබූ අතර ඉන් ඉපයීම රු. 41,182,500 ක් විය.

(iii) වර්ෂය තුල අනුග්‍රාහක ඉල්ලීම් අනුව වැඩසටහන් 151 ක් පවත්වා රු.11,695,000 ක ආදායමක් ඉපැයීමට සැලසුම් කර තිබුණ ද ඉන් වැඩසටහන් 142 ක් පමණක් පවත්වා තිබුණි.

(iv) වර්ෂයේ ඉලක්ක ගත මුළු වැඩසටහන් 328 න් නිලධාරීන් 15,215 ක් පුහුණු කිරීමට අපේක්ෂා කර තිබුණද වැඩසටහන් 244 ක් පවත්වා නිලධාරීන් 10,649 ක් පමණක් පුහුණු කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාගමේ සභාපතිවරයාට හිමි මාසික ඉන්ධන ප්‍රමාණය ලීටර් 170 ක් වුවද 2011 පෙබරවාරි 09 දිනැති අංක. 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අදාල කර ගනිමින් මසකට ලීටර් 225 බැගින් ගිණුම් වර්ෂය තුල රු. 36,575 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව දුරකථන බිල් ප්‍රතිපූරණය කලහැකි වුවද ඊට පටහැනිව සමාගමේ නිලධාරීන් දෙදෙනෙකුට සෑම මසකම පිළිවෙලින් රු. 10,000 හා රු. 5,000 බැගින් එකතුව රු. 120,000 ක් දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. එසේම මෙම දීමනාව ලබාගැනීම සඳහා වවුචරය සමග දුරකථන බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සමාගමේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව නිලධාරියකු වෙනත් ආයතනයකට හෝ අමාත්‍යාංශයකට මුදා හැරීම

නොකලයුතු හා එම නිදහස් කරන ලද කාලය තුල දී කිසිදු දීමනාවක් හෝ වැටුපක් නිදහස් කරන ලද ආයතනයෙන් නොගෙවිය යුතු වුව ද, 2015 දෙසැම්බර් 18 වන දිනැති සභාපතිගේ ලිපිය අනුව සමාගමේ ස්ථිර සේවයේ නිලධාරීන් තිදෙනෙකු පාර්ලිමේන්තුවේ රාජකාරී සඳහා එම ලිපියේ දින සිට මුදා හැර තිබූ අතර එම නිලධාරීන් වෙනුවෙන් වර්ෂය තුල වැටුප් හා වේතන ලෙස රු. 801,861 ක් ගෙවා තිබුණි.

**4.4** **කාර්ය මණ්ඩල පරිපාලනය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 නොවැම්බර් 18 දිනැති DMS/E4/47/9/282/1 හා 2014 සැප්තැම්බර් 17 දිනැති DMS/1676 දරන ලිපි පරිදි සමාගම සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණ ද එම සංඛ්‍යාව ඉක්මවා තනතුරු 04 ක් සඳහා සේවකයින් 12 ක් බඳවාගෙන තිබුණි. ඉන් ස්ථිර පදනම මත බඳවාගත යුතු නිලධාරීන් 04 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු බවද නිරීක්ෂණය විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 නොවැම්බර් 18 වන දිනැති DMS/E4/47/9/282/1 දරන ලිපියට පටහැනිව ඒ ඒ තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටි අනුමත කරවා ගැනීමකින් තොරව තනතුරු 05 ක් සඳහා නිළධාරීන් 05 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර මේ පිළිබඳව පසුගිය විගණන විමසුම් වලින් ද අවධාරණය කර තිබිය දී 2017/2018 වර්ෂය තුල දී නිළධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් රු. 1,345,718 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව තිබිය යුතු සුදුසුකම් සපුරා නොතිබියදී සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරියෙකු බඳවා ගැනීමකින් තොරව මාසිකව රු. 55,786 ක මූලික වැටුපක් ගෙවීමේ පදනම මත 2017 අගෝස්තු 24 දින අවුරුදු 02ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමට නිලධාරියකු බඳවාගෙන තිබුණි. එසේම බඳවා ගැනීමට අදාලව ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු සුදුසු අයදුම්කරු තෝරා ගත යුතු වුවද, උක්ත නිලධාරියා බඳවා ගැනීමේ දී එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂය තුල සමාගම වෙත විවිධ තනතුරු 05 කට අයත් නිලධාරීන් 08 දෙනෙකු බඳවාගෙන තිබුණද, බඳවාගැනීමේ පරිපාටිය අනුව එම නිලධාරීන් අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණි.

(ඉ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව ප්‍රධාන විධායක නිලධාරීගේ උපදෙස් හා නියෝග වලට අනුව අරමුදල් සමාගමේ සියළුම ගිණුම් හා මූල්‍ය කටයුතු මෙහෙයවීම ගණකාධිකාරී තනතුරට පැවරෙන කාර්යයක් වුව ද, 2016 මාර්තු 15 දින සිට 2017 සැප්තැම්බර් 08 දක්වා සමාගමේ ගණකාධිකාරී වශයෙන් කටයුතු කල නිලධාරියා විසින් 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කාර්ය පෞද්ගලික විගණන ආයතනයකට ලබා දී තිබූ අතර, වර්ෂය තුල දී ඒ වෙනුවෙන් රු. 175,000 ක මුදලක් වැයකර තිබුණි.

(ඊ) පත් වීමේ ලිපියට අනුව යම් නිලධාරියකු සිය කැමැත්තෙන් සේවය අවසන් කරන්නේ නම් ඒ බව මාස 03 කට පෙර ආයතනයට දැනුම් දීම හෝ ඒ වෙනුවෙන් මාස 03ක වැටුප් හෝ ගෙවිය යුතු වුව ද, හිටපු ගණකාධිකාරී, සේවයෙන් ඉවත් වීමේ ලිපිය ඉදිරිපත් කළ දිනය වන 2017 සැප්තැම්බර් 07 දිනට පසු දිනයේ සිට එනම් 2017 සැප්තැම්බර් 08 දින සිට සේවයෙන් ඉවත් වී තිබූ නමුත් එම නිලධාරියාගෙන් මාස 03ක අයවිය යුතු වැටුප වන රු. 150,492 අයකර ගැනීමට සමාගම මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.

**4.5** **වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල වාහන අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු වෙනුවෙන් සමාගම විසින් රු. 671,861 ක මුදලක් වැයකර තිබූ අතර 2006 ජනවාරි 25 දිනැති අංක. 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය ප්‍රකාරව හා ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 ඡේදය ප්‍රකාරව වැඩ සහ සේවා සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තරඟකාරීත්වයකට යොමු කර සුදුසු සැපයුම්කරු තෝරාගත යුතු වුවද සමාගම වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සහ මු.රෙ. 756(4) ප්‍රකාරව සමාගම සතුව ඇති 302 – 1353 අංක දරන වාහනය භාවිතයෙන් තොරව අපහරණය කල යුතු තත්ත්වයේ පැවතිය ද ඒ සම්බන්ධයෙන් විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර අපහරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5.** **තිරසාර සංවර්ධනය**

**5.1** **තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසර සංවර්ධන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව සමාගම තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1** **විගණන කමිටු**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 7.4.1 ඡේදයට අනුව විගණන කමිටු රැස්වීම් අවම වශයෙන් මාස 3කට වරක්වත් පැවැත්විය යුතු වුවත් සමාගම ගිණුම් වර්ෂය තුළ එක් විගණන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

**6.2** **ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.2.1** **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 පරිච්ඡේදය පරිදි ජාතික තරඟකාරී ක්‍රමයට ලංසු කැඳවීමේ දී අවම වශයෙන් දින 21 ක් වත් ලංසුපත් කැඳවීම සඳහා දින විවෘතව පැවතිය යුතු වුව ද, සමාගම 2017 ඔක්තෝබර් 03 හා 04 දින පළ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමෙහි එම දින ගණන 12 ක් වූ හෙයින් නැවත එම දින සංශෝධනය කරමින් පුවත්පත් දැන්වීමක් පළ කිරීම සඳහා රු. 54,625 ක නිෂ්කාර්ය වියදමක් දරා තිබුණි.

(ආ) එම පරිච්ඡේදයේ 6.2.1. පරිදි ලංසු ඉදිරිපත් කිරීමේ කාල සීමාව විභව ලංසුකරුවන්ට ලංසු කැඳවීමේ ලේඛන මිලයට ගත හැකි දිනයේ සිට අවසාන දිනය දක්වා පැවතිය යුතු බව දක්වා තිබුණ ද, සමාගම එසේ කටයුතු නොකර ලේඛන මිලට ගත හැකි දිනය 2017 ඔක්තෝබර් 20 දක්වා ද ලංසු කැඳවීමේ අවසාන දිනය 2017 ඔක්තෝබර් 23 දක්වා ද සීමා කරමින් දැන්වීම් පළ කර තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) සමාගමේ 2017-2019 වර්ෂයන් සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේ කාර්යය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව ආයතනයෙන් පරිබාහිර පුද්ගලයෙකුට රු. 250,000 ක මුදලකට ලබා දී තිබුණි.

## 6.3 ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛනය

සමාගමේ ගිණුම් වර්ෂය අප්‍රේල් 01 දිනෙන් ආරම්භ වී ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනෙන් අවසන් වුවද, අයවැය ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලැස්ම ජනවාරි 01 දිනෙන් ආරම්භ වී දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන අයුරින් පිළියෙල කර තිබීම හේතුවෙන් එහි මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය ඇගයීමට නොහැකි විය.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5 ඡේදයට අනුව විගණන වාර්තාව සමඟ වාර්ෂික අවසාන ගිණුම් ඇතුළත් වාර්ෂික වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කොට මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 කට පෙර පාර්ලිමේන්තුවෙහි සභාගත කල යුතු වුවත් සමාගමේ 2014/2015, 2015/2016 හා 2016/2017 ගිණුම් වර්ෂයන් සඳහා එලෙස කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අවධානයට යොමු කරන ලදී . පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (i) | ගිණුම්කරණය | ජර්නල් වවුචර් පිළියෙල කිරීමට ක්‍රියා නොකිරීම, ආදායමට අදාල ඉන්වොයිස් ගිණුම්කරණ පද්ධතිය සමඟ ගැලපීමට නොහැකි වීම. |
| (ii) | අභ්‍යන්තර පාලනය | ගිණුම් අංශය තුළ නිසි වැඩ බෙදීමක් නොමැති වීම |
| (iii) | මානව සම්පත් කළමණාකරණය | කාර්යමණ්ඩල බඳවා ගැනීමේදී බඳවා ගැනීමේ පරිපාටිය අනුව කටයුතු නොකිරීම |
| (iv) | වාහන පාලනය | ධාවන සටහන් පවත්වා නොතිබීම, වාහන අළුත්වැඩියා කිරීමේදී නිසි ක්‍රමවේද අනුගමනය නොකිරීම |